## තනතුරු - ඇබෑර්තු

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පත්කිරීමට, වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ආයුර්වේද වෛද්‍ය සේවය පරිපාලන I , ආයුර්වේද වෛද්‍ය සේවය පරිපාලන II , ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I හා II ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සැලකිය යුතුයි:**

- පහත I.1(අ) සුදුසුකම් සහිත නිලධාරීන් අයදුම්කර නොමැති නම් පමණක් I.1(ආ) , I.1(ඇ) , I.1(ඈ) සහ I.1 (ඉ) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පිළිබඳව පිළිවෙලින් සලකා බලනු ලැබේ.
- සුදුසුකම් සපුරා ඇති එකම ශ්‍රේණියක නිලධාරි කණ්ඩායමක් පමණක් එක් වරකදී අදාල සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර සුදුසුකම් සපුරන දිනට අදාල ශ්‍රේණියේ සිටින නිලධාරීන් පමණක් සලකා බලනු ලැබේ.

01.1 .සුදුසුකම්:

(අ) ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු

හෝ

(ආ) ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ වසර 03 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 03 ක් උපයාගෙන තිබීම.

හෝ

(ඇ) ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ වසර 03කට අඩු සේවා කාලයක් ඇති නිලධාරියෙකු වීම.

හෝ

(ඈ) ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

(ඉ) ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි II ශ්‍රේණියේ වසර 08ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත කාලය තුළ වැටුප් වර්ධක 08ක් උපයාගෙන තිබීම.

(ඉහත 1.1 (ආ), 1.1 (ඇ), 1.1 (ඈ) හෝ 1.1 (ඉ) සුදුසුකම් සමඟ පහත i හා ii සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශිය හෝ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක් පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයක් හෝ විශ්ව විද්‍යාලයකින් ලබා ගත් වසර දෙකකට නොඅඩු ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හා

ii. කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද පර්යේෂණ/ශික්ෂණ ආයුර්වේද රෝහලක දිස්ත්‍රික් ආයුර්වේද රෝහලක/ග්‍රාමීය ආයුර්වේද රෝහලක කාර්යභාර නිලධාරී/වෛද්‍ය අධිකාරී වශයෙන් වසර 03කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම (ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට අයත් තනතුරකට විධිමත් පරිදි පත්වීමක් හෝ වැඩ බැලීමේ පත්වීමක් ලබා සේවය කර ඇති සේවා කාලයද සලකා බලනු ලැබේ.)

1.2. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

1.3. 2025.08.20 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**සටහන:** අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඉහත සඳහන් සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ තමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

02. *තෝරා ගැනීමේ ක්‍රමය:*

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ

03. *අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

සියලුම අයදුම්පත් (ආදර්ශ අයදුම්පත්‍රය www.psc.nw.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය) විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.08.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.) **"ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, මාලිගාව, කුරුණෑගල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

මෙයට,

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආණ්ඩුකාරවර ලේකම්,
ආණ්ඩුකාරවර කාර්යාලය,
වයඹ පළාත.

2025.08. 04 .